# වග දුම්රිය ස්ථානය ආශ්‍රිත කාර්මික උරුමය

ජේ.ඒ.අයි. සංදීපනී[1]

පුරාවිද්‍යාව යනු බහු විෂයීය සබඳතාවක් සහිත විෂය ධාරාවකි. ඒ හා බැඳී පවතින වැදගත් අනු විෂය ප්‍රභේදයක් වශයෙන් කාර්මික පුරාවිද්‍යාව හඳුනාගැනේ. ශ්‍රී ලංකාවේ කාර්මික පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය යටතේ සංවර්ධන ක්‍රියාදාමය හා බැඳි ශේෂයන් පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ. දුම්රිය ප්‍රවාහනය සඳහා එහි දී වැඩි වැදගත්කමක් හිමි වේ. දහනව වැනි සියවසේ වතු වගාවේ ආරම්භයත් සමඟ ඊට අවශ්‍යය යටිතල පහසුකම් වර්ධනය කිරීමක් වශයෙන් දුම්රිය ප්‍රවාහන ක්‍රමය ආරම්භ විය. එහි දී ඇරඹි වැදගත් දුම්රිය මාර්ගයක් වශයෙන් කැලණිවැලි පටු දුම්රිය මාර්ගය හඳුනාගැනේ. වග දුම්රිය ස්ථානය මෙම මාර්ගයට අයත් වැදගත් මුල් දුම්රිය ස්ථානයක් වශයෙන් සැළකේ. මෙම දුම්රිය ස්ථානය කැලණිවැලි මාර්ගයේ මරදාන සිට සැතපුම් 27 1/2 ක් පමණ දුරින් බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයෙහි ලබුගම-කලුඅග්ගල මාර්ගයේ පිහිටා තිබේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ වග දුම්රිය ස්ථානය ආශ්‍රිතව පවතින කාර්මික පුරාවිද්‍යාත්මක වටිනාකම හඳුනාගැනීමයි. මෙකී අරමුණ සාර්ථක කරගනු වස් අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණය සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයන් භාවිත කරනු ලැබීය. ක්ෂේත්‍ර ගවේෂණයේ දී සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය මඟින් ද, ක්ෂේත්‍ර නොවන ගවේෂණයේ දී පූර්ව පර්යේෂණ හා පුස්තකාල අධ්‍යයනයන් මඟින් තොරතුරු රැස්කරගනු ලැබීය. ක්ෂේත්‍රයේ දී අනාවරණය කරගනු ලැබූ තොරතුරු මත දුම්රිය ස්ථානය ආශ්‍රිතව වර්තමානයේ දක්නට ලැබෙන කාර්මික උරුමයන් ලෙස පැරණි දුම්රිය ස්ථානය, ගබඩාව, සංඥා, දැන්වීම් පුවරු, ජල සැපයුම් හා දුම්රිය ස්ථානයට නුදුරින් වක්ඔය හරහා ඉදිකරන ලද දුම්රිය පාලම වැදගත් වේ. ඉදිකිරීම් තාක්ෂණය පදනම් කරගනිමින් මෙකී කාර්මික උරුමයන් වාස්තුවිද්‍යාත්මක  හා යාන්ත්‍රික නිර්මාණ වශයෙන් ප්‍රධාන අංශයන් දෙකක් යටතේ වර්ග කළ හැකිය. දුම්රිය ස්ථානයේ පවතින කාර්මික උරුමයන් අතුරින් පැරණි දුම්රිය ස්ථානය සහ ගබඩා ගොඩනැගිල්ල වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්  අතින් වැදගත් වේ. මේවා දෙමහල් ගොඩනැගිලි වශයෙන් නිමවා ඇති අතර නිර්මාණාත්මක අමුද්‍රව්‍යය වශයෙන් ගඩොල්, රේල් පීලි, හුණු සහ දැව යොදාගෙන ඇත. වර්තමානයේ දී මූලික ඉදිකිරීම් කාර්යයට අමතර වශයෙන් දුම්රිය ස්ථානාධිපති නිල නිවාස වශයෙන් මෙම ගොඩනැගිලි භාවිත කෙරේ. අතීතයේ දී වතු වේදිකාවක් වශයෙන් මෙන්ම ජල සැපයුම් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මකව පැවති වග දුම්රිය ස්ථානයේ කාර්මික උරුමයන් අදවන විට හායනයට ලක්වෙමින් පවතියි.

ප්‍රමුඛ පද : කැලණිවැලි දුම්රිය මාර්ගය, වග දුම්රිය ස්ථානය, කාර්මික උරුමයන්, යාන්ත්‍රික ඉදිකිරීම්

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.isharajayaweera84@gmail.com